ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015 නොවැම්බර් මස 03 වැනි දින |

## ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය අත්කර ගනියි

ශ්‍රී ලංකාව විසින් විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය (Special Data Dissemination Standard - SDDS) අත්කර ගත් බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) විසින් 2015 නොවැම්බර් මස 3 වැනි දින තහවුරු කරන ලදී. මෙය, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික සංඛ්‍යාන වඩා ඉහළ සම්මතයක් දක්වා වැඩිදියුණු කිරීමේ සන්ධිස්ථානයක් වේ. ශ්‍රී ලංකාව, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට අනුගත වූ ලෝකයේ 66 වන සහ ආසියානු සහ පැසිෆික් කලාපයේ 12 වන රට වේ.

**විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයේ ආරම්භය**

බොහෝ ආර්ථිකයන්හි පැවති කාලීන දත්ත නොමැතිකම සහ දත්ත ඌනතාවය හේතුවෙන්, 1990 මැද භාගයේ දී වූ මූල්‍ය අර්බුදය මගින් ඇති වූ හානි වැළැක්වීමට සහ/හෝ අවම කිරීම සඳහා ගත හැකිව තිබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය ගැනීම දැඩි ලෙස ප්‍රමාද විය. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 1996 වසරේ දී විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය සහ 1997 වසරේ දී සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය (General Data Dissemination System - GDDS) ලෙස දත්තවල විනිවිදභාවය පිළිබඳව වූ සම්මත 2 ක් හඳුන්වා දෙන ලදී.

ආර්ථික හා මූල්‍ය දත්ත මහජනතාව වෙත සැපයීම සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වූ හෝ ප්‍රවේශ වීමට අපේක්ෂා කරන සාමාජික ආර්ථිකයන්ට මග පෙන්වීම, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය මගින් අපේක්ෂා කෙරේ. සාමාන්‍ය දත්ත ප්‍රකාශන සම්මතය යනු දත්ත පද්ධතිවල අඩු වර්ධනයක් සහිත සාමාජික ආර්ථිකයන්, ඔවුන්ගේ දත්ත වැඩිදියුණු කිරීමෙහි ඇති අවශ්‍යතාව ඇගයීම සහ ප්‍රමුඛතාව සැපයීම සඳහා මෙහෙයවනු ලබන සංඛ්‍යාන පද්ධතියකි.

විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය, දත්ත ලබා ගැනීමට ඇති අවස්ථා (දත්ත ආවරණය, කාල පරාසය සහ නියමිත කාලයට ඉදිරිපත් කිරීම), පොදු ජනතාවට දත්ත ලබා ගැනීමට ඇති හැකියාව, ප්‍රකාශිත දත්තවල පරිපූර්ණභාවය සහ දත්තවල ගුණාත්මකභාවය වශයෙන් දත්ත ප්‍රකාශන මිනුම් හතරක් යටතේ විග්‍රහ කරනු ලබයි. විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය මූර්ත අංශය, රාජ්‍ය මූල්‍ය අංශය, මූල්‍ය අංශය සහ විදේශීය යන අංශ ආවරණය වන පරිදි කාණ්ඩ 22කට අදාළ සාර්ව ආර්ථික සංඛ්‍යාන ප්‍රකාශන නිර්දේශ කරයි. විශේෂිත දත්ත ප්‍රකාශනය සඳහා 2013 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ප්‍රකාශිත "දායකයන් හා පරිශීලකයන් සඳහා විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය පිළිබඳ මාර්ගෝපදේශනය (SDDS Guide for Subscribers & Users) " නමැති ප්‍රකාශනයේ නියම කරන ලද මාර්ග නිර්දේශයන් පිළිපැදිය යුතු වේ. විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයේ ක්‍රියාපටිපාටිවලට අනුව සෑම දත්ත කාණ්ඩයක් සඳහාම ඉදිරියේ දී දත්ත ප්‍රකාශ කෙරෙන දින දර්ශනයක් (Advance Release Calendar) සහ දත්ත ප්‍රකාශන ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු (Metadata) සැපයීම අවශ්‍ය වේ. එසේම විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය මගින් සැපයෙන දත්ත ඉදිරිපත් කිරීම සඳහා ජාතික සංක්ෂිප්ත දත්ත පිටුවක් (National Summary Data Page) පවත්වා ගෙන යෑම ද එවැනිම වැදගත්කමක් උසුලයි.

**සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය (GDDS) සහ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය (SDDS) අතර ඇති ප්‍රධාන වෙනස්කම්**

සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමයේ සහ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය අතර ඇති මූලික වෙනස්කම් පහත පරිදි වේ.

- සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමයට ප්‍රවේශ වීමට සපුරාලිය යුතු නිර්දේශ, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයේ නිර්දේශවලට වඩා ලිහිල්ය. සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය, සංඛ්‍යාලේඛන පිළියෙල කිරීම සහ ප්‍රචාරණය සඳහා අනුගමනය කළ යුතු සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර, එමගින් වඩාත් අවධාරණය කෙරෙනුයේ

ක්‍රමානුකූලව දත්තවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමයි. මේ අතර, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට ප්‍රවේශවීමට ආර්ථිකයන් නිරීක්ෂණය කළ යුතු විශේෂ සම්මතයන්, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය මගින් අවධාරණය කෙරෙයි.

- සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමයට සහභාගිවීම ජා.මූ. අරමුදලේ සාමාජික රටවල් සියල්ලටම විවෘත වන අතර විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය ඉලක්ක කර ඇත්තේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළවලට ප්‍රවේශ වූ සහ ප්‍රවේශ වීමට බලාපොරොත්තු වන සාමාජික රටවලට වේ.

- සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය, එය අනුගමනය කරන රටවල් සඳහා දැනට අනුගමනය කරන ක්‍රියාපිළිවෙත වැඩිදියුණු කිරීම අවසන් කිරීමට නියමිත අනාගත දින නියමයක් නොමැත. එනමුත්, විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට ප්‍රවේශ වන රටවල් එම සම්මතයට ප්‍රවේශ වීමට ප්‍රථම අදාළ සියලුම අවශ්‍යතා සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

- සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය මූලිකවම අවධානය යොමු කරනුයේ දත්ත දියුණු කර ගැනීමට ඇති අවශ්‍යතාවය ඇගයීමට ක්‍රියාවලියක් සැකසීම තුළින් දත්තවල ගුණාත්මක බව වැඩි කිරීම වන අතර විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය අවධානය යොමු කරනුයේ දැනටමත් ගුණාත්මක බවින් ඉහළ මට්ටමකට වර්ධනය කර ඇති දත්ත පවතින රටවල්වල දත්ත ප්‍රචාරණයයි.

**විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට යොමු වීමේ ප්‍රතිලාභයන්**

ආර්ථිකයක් විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට යොමු වීම තුළින් ප්‍රධාන වශයෙන් දත්ත සම්පාදනයේ සංගතභාවය, දත්තයන්හි ගුණාත්මකභාවය සහ විනිවිදභාවය වැඩිදියුණු වීම යනාදී විවිධ මාර්ගවලින් ප්‍රතිලාභ ළඟා කර ගත හැකිය. ස්වෛරීත්ව බැඳුම්කර සඳහා අඩු පොලී අනුපාතිකයන් හිමි වීම, විනිමය අනුපාතිකයන්ගේ උච්චාවචනයන් අවම වීම, හිතකර ණය ශ්‍රේණිගත කිරීම් ලැබීම, ඉහළ ආයෝජන ප්‍රතිලාභ සහ පෞද්ගලික ණයගැතියන්ට අඩු පොලියක් හිමි වීම වැනි ප්‍රධාන ප්‍රතිලාභයන් විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට යොමු වීමෙන් හිමිවන බව අධ්‍යනයන් මගින් පෙන්නුම් කර ඇත.

**විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය වෙත වූ ශ්‍රී ලංකාවේ ගමන් මඟ**

2000 ජූලි මාසයේ සිට ශ්‍රී ලංකාව මූර්ත අංශය, රාජ්‍ය මූල්‍ය අංශය, මූල්‍ය අංශය සහ විදේශීය අංශය ආවරණය වන පරිදි විශේෂිත වූ දත්ත කාණ්ඩ 24 ක් යටතේ සාමාන්‍ය

දත්ත ප්‍රකාශන ක්‍රමය සඳහා දායක වූ අතර විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය ලබා ගැනීම සඳහා 2012 වසරේ සිට කටයුතු කරන ලදී . ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකාවේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය පිහිටුවීමේ අතරමැදි නියෝජිත ආයතනය ලෙස මුදල් අමාත්‍යාංශය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් දත්ත ප්‍රකාශන ආයතන සමඟ එක්ව විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට අනුගත වීම සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කළේය.

ශ්‍රී ලංකාව ප්‍රකාශනයට අවශ්‍ය දත්ත කාණ්ඩ සියල්ලම විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ආවරණය, කාල පරාසය සහ නියමිත කාලයට ඉදිරිපත් කිරීම යනාදිය සපුරා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාව සියලුම දත්ත ප්‍රකාශන ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු (Metadata), විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයේ අවශ්‍යතාවයට අනුව දත්ත කාණ්ඩ නිකුත් කළ යුතු දිනයන් සහිත ඉදිරි දත්ත නිකුත් කිරීමේ දින දර්ශනය ද ප්‍රකාශයට පත් කර ඇත. දත්ත පරිශීලනය කරන්නන්ට පහසු වන පරිදි සිය දත්ත කාණ්ඩවලට අයත් දත්ත (නවතම සහ පෙර දත්ත ශ්‍රේණි) මෙන්ම දත්ත ප්‍රකාශන ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු (Metadata) සහ ඉදිරි දත්ත නිකුත් කිරීමේ දින දර්ශනය ද ඇතුළත් ජාතික සංක්ෂිප්ත දත්ත පිටුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. 2015 මාර්තු මස සිට ජා.මූ. අරමුදලේ අධීක්ෂණය යටතේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය අත්හදා බැලීම් සිදු කරනු ලැබූ අතර එය මෙම සම්මතයට ප්‍රවේශ වීම සඳහා වූ අවශ්‍යතාවයන්ට අනුකූලව සාර්ථක වූ බව ජා.මූ. අරමුදල මගින් සනාථ කරන ලදී.

ශ්‍රී ලංකාවේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට අදාළ තොරතුරු ජා.මූ. අරමුදලේ ප්‍රකාශන සම්මත නිවේදන පුවරුව (Dissemination Standards Bulletin Board – DSBB) http://dsbb.imf.org/Pages/SDDS/CtyCtgList.aspx?ctycode=LKA මගින් ලබාගත හැක.